**එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පණි ලිමිටඩ් - 2019**
**-----------------------------------------------------------**

**1.1 මතය**
**------**

**ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමෙහි 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.**

**සමාගමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.**

**1.2 මතය සඳහා පදනම**
**--------------------**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**
**------------------------------------------------------------------------------------------**

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත්කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.**

**සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.**

**2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගම වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.**

**1.4** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් හඳුනා නොගැනීම මගින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනු දෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල සමාගමේ කාර්යන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබුවේද යන බව;

- යම් අදාල ලිඛිත නීතියනට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව;
- සමාගමේ සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව ව කටයුතු කර ඇති බව;
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුල සහ අදාල නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව;

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 අධිකාරි බලය නොලත් ගණුදෙනු

| විගණන ගැටළුව | කළමණාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2015 ජුනි 17 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක 3/2015 හි 2.8 ඡේදයට අනුකූලව, මාසික දීමනාව, පැමිණීමේ දීමනාව හෝ චක්‍රලේඛයේ සඳහන් දීමනා හැර වෙනත් ගෙවීම්, සභාපතිවරයාට ගෙවිය හැක්කේ මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශයෙන් පමණි.<br>කෙසේ වෙතත්, 2015 ජනවාරි සිට 2018 නොවැම්බර් දක්වා කාල සීමාව සඳහා වෘත්තීය දීමනාවක් ලෙස රු. 53,195,450 ක මුදලක් එන්එස්බී අරමුදල් කළමනාකරණ සමාගමේ සභාපතිවරයාට ඉහත චක්‍රලේඛයට අනුව පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගැනීමකින් තොරව ගෙවා ඇත. ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ සභාපතිවරයා නිල බලයෙන් සමාගමේ සභාපතිවරයා ලෙස කටයුතු කරනු ලබයි. | එම චක්‍රලේඛයට අවධානය යොමු කිරීමෙන් පසුව 2019 දී කිසිදු දීමනාවක් ගෙවා නොමැත.<br>ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සඳහා වේතන ප්‍රතිපත්තිය සකස් කර ඇති අතර එය අනුමැතිය සඳහා මානව සම්පත් හා වේතන කමිටු මණ්ඩලය (BHRRC) සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. | සමාගම පොදු ව්‍යවසාය චක්‍රලේඛවලට අනුකූල විය යුතුය. |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන ගැටළුව | කළමණාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2016 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා ගුවන් සේවා ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ප්‍රධාන කළමනාකරුවෙකු ලෙස සමාගම පත් කර තිබුණි. මේ සම්බන්ධයෙන්, භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ශේෂය රු.246,939,587 ක් වූ අතර, එම ශේෂයෙන් 2019 වසර අවසන් වන විට රු. 88,939,587 ක ශේෂයක් තවදුරටත් හිඟව පැවතුණි. | අමාත්‍යාංශයට ඉල්ලීම් කීපයක් කිරීමෙන් පසු 2016.12.31 දින සමාගමට රු.මිලියන 158 ක් ලැබුණි.තවද සමාගම විසින් 2020 පෙබරවාරි මාසයේදී ඉතිරි මුදල පියවන ලෙස ඉල්ලීම් කර තිබුණි. | සමාගමට ලැබිය යුතු මුදල අය කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉකුත් වර්ෂයේ අනුරූපී ලාභය රු. 35,500 හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ලාභය රු. 515,409,392 ක් විය. එබැවින්, 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලය රු. 515,373,892 කින් හෙවත් සියයට 1,451,757 කින් වැඩිවී තිබුණි. වෙළඳපල පොලී අනුපාතවල හිතකර චලනයන් හේතුවෙන් මූල්‍ය උපකරණවල සාධාරණ වටිනාකම ඉහළ යාම මෙම වැඩිවීමට හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමයන්ගේ උපනති විශ්ලේෂණය

ප්‍රධාන වශයෙන් ඉහළ පොලී දරණ සුරැකුම්පත්වල වටිනාකම වැඩිවීම හේතුවෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාගමේ පොලී ආදායම රු.මිලියන 183 කින් හෙවත් සියයට 14 කින් ඉහළ ගොස් තිබුණි. සමාගමේ ණය ගැනීම් කළඹේ වැඩිවීම හේතුවෙන් පොලී වියදමද රු. මිලියන129 කින් හෙවත් සියයට 14 කින් වැඩිවී තිබුණි. ගාස්තු පදනම් කරගත් ආදායම් ක්‍රියාකාරකම් පුළුල් කිරීම හේතුවෙන් ප්‍රධාන වශයෙන් භාරකාර කටයුතු වැඩිදියුණු කිරීම නිසා 2019 දී ගාස්තු ආදායම රු.මිලියන 8 කින් හෙවත් සියයට 17 කින් වැඩි වී තිබුණි.වෙළඳපල පොලී අනුපාතවල හිතකර චලනයන් හේතුවෙන් ,2018 වර්ෂයේ රු. මිලියන 355 වෙළඳ අලාභය හා සැසඳීමේදී සමාගම 2019 වර්ෂයේ දී රු. මිලියන 472 ක වෙළඳ ලාභයක් වාර්තා කර තිබුණි. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී 2019 වර්ෂය තුළ වෘත්තීය ගාස්තු ගෙවීමක් සිදු නොවීම හේතුවෙන් පුද්ගලික පිරිවැය රු. මිලියන 8 කින් අඩු වී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයේ අනුපාත හා ආංශික අනුපාත සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ තෝරාගත් වැදගත් ගිණුම්කරණ අනුපාතයන් පිළිබඳව පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| විස්තරය | ආංශික අනුපාත | බැංකුව 2019 | බැංකුව 2018 |
|---|---|---|---|
| සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය | 6 | 4.78 | 0.02 |
| සාමාන්‍ය ස්කන්ධය මත ප්‍රතිලාභ අනුපාතය | 28.5 | 17 | 0.002 |
| බර තැබූ අවදානම් ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය | 27.6 | 27.88 | 24.65 |

(ආංශික තොරතුරු මහ බැංකු වෙබ් අඩවියෙන් ලබාගෙන ඇත )

(i) සමාගමේ බර තැබූ අවදානම් ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය ආංශික අනුපාතයට වඩා ඉහළ අගයක් ගන්නා අතර එය 2018 මූල්‍ය වර්ෂය හා සැසඳීමේදී සියයට 3.23 කින් ඉහළ ගොස් තිබුණි.

(ii) 2018 වර්ෂය හා සැසඳීමේදී 2019 වර්ෂයේදී සමාගමේ සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය සහ සාමාන්‍ය ස්කන්ධය මත ප්‍රතිලාභ අනුපාතය පිළිවෙලින් සියයට 4.76 කින් සහ සියයට 17 කින් වැඩි වී තිබුණි.

(iii) **2018 වර්ෂයේදී රු. මිලියන 2,723 ක්ව පැවති සමාගමේ මූලික ප්‍රාග්ධනය 2019 වර්ෂයේදී රු. මිලියන 3,337 දක්වා සියයට 23 කින් ඉහළ ගොස් තිබුණි. එය අවම මූලික ප්‍රාග්ධන අවශ්‍යතාවය වන රු. මිලියන 1,000 ට වඩා ඉහළ අගයකි. සමාලෝචිත වර්ෂය තුළදී රඳවා ගත් ඉපැයීම් රු. මිලියන 386 කින් ඉහළ යාම හේතුවෙන් මූලික ප්‍රාග්ධනය ඉහළ ගොස් තිබුණි.**

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

| විගණන ගැටලු | කළමණාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 නොවැම්බර් මස 02 වන දින පැවති රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2018 වර්ෂයේ ප්‍රසාද දීමනා වශයෙන් රු.2,543,546 ක මුදලක් අනුමත කර තිබුණි. කෙසේ වෙතත්, 2018 වර්ෂය සඳහා බදු ගෙවීමෙන් පසු ලාභය රු .35,500 ක් වූ අතර ඉහත ප්‍රසාද දීමනා සඳහා ප්‍රතිපාදන ලබා දී ඇත්තේ 2018 මූල්‍ය ප්‍රකාශන වෙනුවට 2019 මූල්‍ය ප්‍රකාශන මතය. | සාමාන්‍යයෙන්, බැංකුවේ කාර්යසාධන ප්‍රසාද ගෙවීමේ ක්‍රමයට අනුකූලව සමාගම කාර්ය සාධන ප්‍රසාද දීමනා ගෙවනු ලබයි.කෙසේ වෙතත්, සමාගමේ කාර්යසාධනය මත පදනම්ව කාර්ය සාධන ප්‍රසාද දීමනා ගෙවීමට සමාගමේ මානව සම්පත් හා වේතන කමිටුවේ දී (BHRRC) සමාගම විසින් යෝජනා කර තිබුණි. | සමාගමේ කාර්යසාධන ප්‍රසාද දීමනා ප්‍රතිපත්තිය සමාලෝචිත වර්ෂය සඳහා වන ලාභයට අනුකූල විය යුතුය. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන ගැටලු | කළමණාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2003 ජුනි 02 දිනැති PED / 12 රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛයේ 9 වන පරිච්ඡේදයේ 9.2 සහ 9.3 ඡේදවලට අනුව අනුමත සේවක සංඛ්‍යාව තීරණය කර නොමැති අතර සමාගමට සේවකයින් බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයක්ද නොතිබුණි. | සටහන් කර ගන්නා ලදි. | සමාගමට අනුමත සේවක සංඛ්‍යාවක් හා බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයක් තිබිය යුතුය. |
| (ආ) 2018 මාර්තු 02 දින සිට බලපැවැත්වෙන පරිදි කොන්ත්‍රාත් පදනම යටතේ ලේකම් තනතුර සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමට බඳවාගත් නිලධාරියෙකු ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ශාඛාවක් වෙත අනුයුක්ත කර තිබුණි | සේවකයා ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමේ ප්‍රධාන කාර්යාලය වෙත නැවත කැඳවා තිබුණි. | අවශ්‍යතාවයට අනුකූලව බඳවාගත් සේවකයන් සමාගම විසින් ලෙස භාවිතා කල යුතුය. |